## 2023-12-11 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

**01. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ කාර්යභාරය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත බලතල පැවරීම**

1996 දී එවකට සමාජ සේවා සහ සමාජ සුබසාධන අමාත්‍යාංශය යටතේ සහන කටයුතු, පුනරුත්ථාපන කටයුතු සහ ප්‍රතිසංස්කරණ කටයුතු සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ස්ථාපිත කරනු ලැබ ඇති අතර, එම ආයතනය 2007-01-01 දින සිට ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය ලෙස නම් කර රාජ්‍ය ආයතනයක් වශයෙන් මේ දක්වා ක්‍රියාත්මකව පවතී. එම මධ්‍යස්ථානයේ කාර්යභාරය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට හැකි වන පරිදි දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන් වෙත අවශ්‍ය බලතල පැවරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව සම්බන්ධයෙන් කොරියානු ජනරජය සහ ශ්‍රී ලංකාව අතර ගිවිසුමකට එළඹීම**

සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව සම්බන්ධයෙන් කොරියානු ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර ගිවිසුමකට අත්සන් තැබීමට යෝජනා වී තිබේ. ඒ අනුව, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, විදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් සහ කොරියානු ජනරජයේ අදාළ ආයතනවල නියෝජිත කණ්ඩායමක් එක්ව කෙටුම්පත් ගිවිසුමක් සකස් කරනු ලැබ ඇත. එමඟින් රාජ්‍යයන් දෙකෙහිම අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම, පැමිණිලි ගොනු කිරීම සහ අපරාධ මැඩ පැවැත්වීමේ සඵලතාව වැඩිදියුණු කිරීමට අපේක්ෂා කරනු ලබයි. එකී ගිවිසුම, දෙපාර්ශ්වය අතර අත්සන් තැබීමටත්, ඉන් අනතුරුව දෙරටේ රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල මඟින් අපරානුමත කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பனை அவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

## 03. මධ්‍යම, උතුරු සහ නැගෙනහිර පළාත් කේන්ද්‍ර කර ගනිමින් ප්‍රජා පාදක සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස එකඟතා ගිවිසුමකට අත්සන් තැබීම

කොරියානු වොන් බිලියන 2.172ක ප්‍රදානයක් යටතේ ශ්‍රී ලංකාවේ මධ්‍යම, උතුරු සහ නැගෙනහිර පළාත් කේන්ද්‍ර කර ගනිමින් ප්‍රජා පාදක සංචාරක සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අදාළව නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා කොරියානු සංචාරක සංවිධානය සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය අතර එකඟතා ගිවිසුමකට එළඹීම පිණිස 2023-01-09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එකී නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව එහි සාර්ථකත්වය මත සම්පූර්ණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ නමුත්, කොරියානු සංචාරක සංවිධානයේ නියෝජිතයින් විසින් අදාළ පළාත්වල සංචාරය කිරීමෙන් අනතුරුව නියමු ව්‍යාපෘතියක් වෙනුවට සැලසුම් කර ඇති පරිදි සමස්ත ව්‍යාපෘතිය එකවර ආරම්භ කිරීමට එකඟතාව පළ කර ඇත. ඒ අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි දෙපාර්ශ්වය අතර සංශෝධිත ගිවිසුමකට එළඹීමට ගනු ලැබ ඇති ක්‍රියාමාර්ග පිළිබඳව සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ කරුණු අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගෙන, ඒ අනුව කටයුතු කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ එකඟතාව පළ කරන ලදී.

## 04. මානව හිමිකම් පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ස්ථාවර කමිටුවක් ස්ථාපිත කිරීම

මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ ශ්‍රී ලංකාවේ කටයුතු සම්බන්ධයෙන් පසුවිපරම් සහ වාර්තා කිරීමේ ඵලදායි දේශීය ක්‍රියාවලියක් සඳහා ස්ථාවර ජාතික රාමුවක් වශයෙන් කටයුතු කිරීමට හැකි වන පරිදි මානව හිමිකම් පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ස්ථාවර කමිටුවක් පත් කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, විදේශ කටයුතු අමාත්‍යාංශය සම්බන්ධීකරණ/ප්‍රධාන නියෝජිතායතනය ලෙස කටයුතු කරමින් මානව හිමිකම් පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ස්ථාවර කමිටුවක් ස්ථාපිත කිරීම පිණිස විදේශ කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම පිණිස කඩිනම් තීරණ ගැනීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම**

වසර 2030 වන විට ජාතිකව නිර්ණය කළ දායකත්ව ඉලක්ක සපුරා ගැනීම සඳහා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව හඳුනා ගනු ලැබ ඇත. දැනට පවතින ක්‍රමවේද අනුගමනය කරමින් එවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ගත වන කාලය මෙන්ම එකී ක්‍රමවේද අනුව කටයුතු කිරීමේදී උනන්දුවක් දක්වන ආයෝජකයින්ට මුහුණ පෑමට සිදු වන අපහසුතා සැලකිල්ලට ගෙන, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීම පිණිස නව ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු බවට 2023-11-20 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සම්බන්ධයෙන් තීරණ ගැනීමට සහ අදාළ ආයතන විසින් එකී තීරණ කාර්යක්ෂමව හා කඩිනමින් ක්‍රියාත්මක කරනු ලබන බව අධීක්ෂණය කිරීමට පහත සඳහන් ආයතන නියෝජනය වන පරිදි ඒකාබද්ධ ස්ථාවර කමිටුවක් පත් කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී:

* ජනාධිපති කාර්යාලය (කමිටු සභාපති)
* අග්‍රාමාත්‍ය කාර්යාලය
* මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
* ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය
* වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
* පරිසර අමාත්‍යාංශය
* සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
* කර්මාන්ත අමාත්‍යාංශය
* විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය
* වාරිමාර්ග අමාත්‍යාංශය
* ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය
* ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
* ලංකා විදුලිබල මණ්ඩලය

**06. ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින් සඳහා වන වීසා අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයෙකු පත් කිරීම**

ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශිකයින් සඳහා වන වීසා අයදුම්පත් මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයෙකු වශයෙන් කටයුතු කිරීම පිණිස GBS Technology Services & IVS Global - FZCO සහ VFS VF Worldwide Holdings Ltd විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ඇගයීම පිණිස ඇගයීම් කමිටුවක් පත් කිරීමට 2023-09-11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කරන ලදී. ඒ අනුව පත් කරනු ලැබ ඇති ඇගයීම් කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ නිර්දේශ පරිදි කටයුතු කිරීමටත්, නීතිපති විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ අනුව කෙටුම්පත් කරනු ලැබ ඇති අදාළ ගිවිසුමට අත්සන් තැබීමටත් මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**07. රංගල පොලිස් ස්ථානය ස්ථාපිත කිරීම සඳහා ඉඩම් කොටසක් ශ්‍රී ලංකා පොලිසිය වෙත අත්කර ගැනීම**

දැනට ගැටගහවෙල වැවිලි සමාගමට අයත් ගොඩනැගිල්ලක කුලී පදනම මත පවත්වාගෙන යනු ලබන රංගල පොලිස් ස්ථානයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එහි රාජකාරියේ නියුතු නිලධාරීන්ට විධිමත් පරිදි සිය රාජකාරී කටයුතු සිදු කිරීමට අපහසු වී ඇත. එබැවින්, රංගල පොලිස් ස්ථානය ස්ථාපිත කිරීම සඳහා උඩපුස්සැල්ලාව වැවිලි සමාගමට අයත් ඩක්වාරි වතුයායෙන් අක්කර 02ක ඉඩම් කොටසක් ශ්‍රී ලංකා පොලිසිය වෙත අත්කර ගැනීම පිණිස මහජන ආරක්ෂක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**08. දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රත්මලාන දුම්රිය ඩීසල් බලවේග කට්ටල කර්මාන්තශාලාව සැලසුම් කර ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම**

ආසියානු සංවර්ධන බැංකු අරමුදල් මගින් ක්‍රියාත්මක වන දුම්රිය කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රත්මලාන දුම්රිය ඩීසල් බලවේග කට්ටල කර්මාන්තශාලාව සැලසුම් කර ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ජාත්‍යන්තර ලංසු කැඳවා ඇත. ඒ අනුව, ලංසු 09ක් ඉදිරිපත් වී ඇති අතර ලංසු 02ක් ප්‍රතික්ෂේප වී තිබේ.

ඉහිරි ලංසු 07 ඇගයීමට ලක් කිරීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති වයිනා සිවිල් ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන් සමාගම වෙත එකී කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා තෙල් සහ ලිහිසි තෙල් මිල දී ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා තෙල් සහ ලිහිසි තෙල් මිල දී ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවා ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව විසින් එක් එක් අයිතමය මත පදනම්ව Lanka IOC PLC වෙතින් සහ Chevron Lubricant Lanka PLC වෙතින් අදාළ තෙල් සහ ලිහිසි තෙල් මිල දී ගැනීම නිර්දේශ කර ඇත. ඒ අනුව, එම සමාගම් දෙක වෙත අදාළ ප්‍රසම්පාදනයන් පිරිනැමීම පිණිස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. යටත්විජිත යුධ අධිකරණයේ තීන්දුවක් මත වසර 108කට පෙර සිදු කළ එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් මැතිතුමාගේ ඝාතනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්වීම**

ශ්‍රී ලංකාවේ යටත්විජිත පාලන අධිකාරිය විසින් රජයට එරෙහිව කැරලි කෝලාහල සහ රාජද්‍රෝහී ක්‍රියාවන් සිදු කළේ යැයි චෝදනා එල්ල කරමින් යුද අධිකරණයක් හමුවට පමුණුවා, රාජද්‍රෝහී චෝදනාවට වරදකරු කොට, එවකට 27 වියැති එඩ්වඩ් හෙන්රි පේද්‍රිස් මැතිතුමා 1915-07-07 දින කිසිදු අභියාචනයක් නොසලකා මරණ දඬුවමට ලක් කරනු ලැබ ඇත. මිය ගිය හෙන්රි පේද්‍රිස් මැතිතුමාගේ දේහය, යුද නීතිය යටතේ වරදකරු වූ අපරාධකරුවෙකු ආදාහනය කිරීමට නියම කර ඇති ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින්, හෙළි නොකළ පරිශ්‍රයක ආදාහනය කර තිබේ. එතුමාගේ ඝාතනය එවකට මෙරට පාලනය කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් සිදු කරන ලද සැලැස්මක ප්‍රතිඵලයක් වශයෙන් පසුව හඳුනා ගනු ලැබ තිබේ. ඒ අනුව, එම ඝාතනය පිළිබඳව සැබෑ තොරතුරු අනාවරණය කර ගෙන එතුමාට යුක්තිය ඉටු කිරීම පිණිස අදාළ කරුණු අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු අනිල් ගුණරත්න

මහතාගේ සභාපතිත්වයෙන් යුත් ත්‍රිපුද්ගල කමිටුවක් පත් කිරීම පිණිස ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**11. 1937 අංක 2 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ VIII වන උපලේඛනය සංශෝධනය කිරීම**

2022 අංක 7 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත මගින් අවසන් වරට සංශෝධනය කරන ලද 1937 අංක 2 දරන වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ VIII වන උපලේඛනය යටතේ වන ශාක වර්ගීකරණ ක්‍රමවේද අනුව ශාක කුල 121ට අයත් ශාක විශේෂ 680කට අධික සංඛ්‍යාවක් ආරක්ෂිත ශාක ලෙස ප්‍රකාශයට පත් කර ඇත. එහෙත් වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි එකී උපලේඛනය සංශෝධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන තිබේ. ඒ සඳහා ශාක වර්ගීකරණය සහ නාමකරණය, පරිසර විද්‍යාව, වන ජීවී සංරක්ෂණය හා මානව උද්භිද විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රවල ප්‍රවීණයන්ගෙන් සමන්විතව කමිටුවක් පත් කිරීමටත්, එකී කමිටුවේ නිර්දේශ පරිදි වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ VIII වන උපලේඛනය සංශෝධනය කිරීමටත් වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**12. බෙදුම් නඩු පනතට සංශෝධන**

බෙදුම් නඩු කඩිනමින් අවසන් කිරීම පිණිස බෙදුම් නඩු පනතට යෝග්‍ය සංශෝධන හඳුන්වා දීම සඳහා 2023-09-25 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **රක්ෂිත බන්ධනාගාරගත කිරීමට විකල්පයක් වශයෙන් නිවාස අඩස්සියේ රඳවා තැබීම පිණිස නීතිමය විධිවිධාන හඳුන්වා දීම**

ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ පවතින තදබදය දීර්ඝකාලීන ගැටලුවක් ලෙස හඳුනාගෙන තිබේ. එම ගැටලුවට පිළියමක් වශයෙන් රක්ෂිත බන්ධනාගාරගත කිරීමට/බන්ධනාගාරගත කිරීමට විකල්පයක් ලෙස සුළුසු නඩු කටයුතුවල සැකකරුවන් සහ වැරදිකරුවන් නිවාස අඩස්සියේ රඳවා තැබීමට නීති ප්‍රතිපාදන හඳුන්වා දීම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර ඇත. එකී නිලධාරි කමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව මත පදනම්ව යෝග්‍ය නීති හඳුන්වා දීම සඳහා පනත් කෙටුම්පතක් සකස් කරන ලෙස නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දීම පිණිස අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

14. **2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම**

සීනි ආනයනයේදී බලපැවැත්වූ කිලෝග්‍රෑමයට ශත 25ක් වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 50/- දක්වා ඉහළ නැංවීම සඳහා 2023-10-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එකී තීරණය බලාත්මක කිරීම පිණිස 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ විධිවිධාන යටතේ 2023-11-01 දිනැති අංක 2356/20 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය මගින් පනවනු ලැබ ඇති නියමය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

15. **ඉඩම් අවසරපත්‍ර හා දීමනාපත්‍රලාභීන්ට රජයේ ඉඩම්වල පරම අයිතිය ලබා දෙන "උරුමය වැඩසටහන"**

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසරපත්‍ර හා දීමනාපත්‍ර ලබා දී ඇති ගොවි ජනතාව ප්‍රමුඛ මහජනතාවට තමන් භුක්ති විඳින හෝ සංවර්ධනය කරන ලද ඉඩම් සඳහා පරම අයිතිය නොමැති වීමෙන් අදාළ භූමිය මානව

හා සංවර්ධන අවශ්‍යතාවන්ට යොදවා ගැනීමේදී විවිධ ගැටලුවලට මුහුණ පෑමට සිදුවී ඇත. එබැවින්, එම ගැටලු අවම කර ගැනීම සඳහා එවැනි ඉඩම්වල පරම අයිතිය ගොවි ජනතාව ප්‍රමුඛ මහජනතාවට ලබා දීම පිණිස පවතින නිතිමය රාමුව තුළ අවශ්‍ය පියවර ගැනීමට සහ 2024 වර්ෂය ආරම්භයේදී එකී වැඩපිළිවෙල ආරම්භ කර වසර කිහිපයක් තුළ සම්පූර්ණයෙන්ම නිම කිරීමට හැකි වන පරිදි "උරුමය වැඩසටහන" නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම පිණිස 2024 අයවැය කථාවේදී ගරු ජනාධිපතිතුමා විසින් යෝජනා කරන ලදී. එම වැඩසටහන අදියර තුනක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, එමඟින් පවුල් ලක්ෂ විස්සකට නේවාසික හා ගොවි බිම්වල පරම අයිතිය ලබා දීමට අපේක්ෂා කරනු ලබයි. ඒ අනුව, අදාළ පියවරයන් අනුගමනය කරමින් ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අවසරපත්‍ර හා දීමනාපත්‍ර ලබා දී ඇති ඉඩම් කොටස් සඳහා රජයේ ඉඩම් ආඥාපනතේ 2 වගන්තිය යටතේ පරම අයිතිය සහිත ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීම පිණිස සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 16. යාපනයේ කුඩා දූපත් හි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම

යාපනය අර්ධද්වීපයේ ඩෙල්ෆ්, නයිනතිව් සහ අනලතිව් යන දූපත්වල පදිංචිකරුවන්ට විදුලිය සැපයුම ලබා දීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 11ක පාර්ශ්වීය ප්‍රදානයක් ශ්‍රී ලංකා රජයට සැපයීමට ඉන්දීය රජය කැමැත්ත පළ කර තිබේ. ඒ අනුව, එළඹී අවබෝධතා ගිවිසුමේ කොන්දේසි අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දියානු කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ලංසු කැඳවා ඇත. ඒ සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව ඇගයීමට ලක් කර අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව එකී කොන්ත්‍රාත්තුව U-Solar Clean Energy Solutions (Pvt) Ltd. සමාගම වෙත ප්‍රදානය කිරීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 17. පූනකරි වැව මතුපිට ස්ථාපනය කිරීමට යෝජිත මෙගාවොට් 700ක සූර්ය බලශක්ති ව්‍යාපෘතිය

පූනකරි වැවේ සිට නව කිලිනොච්චි ග්‍රිඩ් උපපොළ දක්වා අවශ්‍ය සම්ප්‍රේෂණ රැහැන් මාර්ග ඉදිකිරීම ඇතුළුව 100%ක බැටරි බලශක්ති ගබඩා පද්ධතියක් සහිත මෙගාවොට් 700ක සූර්ය බලශක්ති බලාගාරයක් සංවර්ධනය කිරීම සඳහා යුනයිටඩ් සෝලර් එනර්ජි සමාගම විසින්

ඉදිරිපත් කරන ලද යෝජනාව ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගැනීමටත්, ව්‍යාපෘති යෝජනාව ඇගයීමට සහ බලශක්තිය මිල දී ගැනීමේ ගාස්තු නිරණය කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවක් පත් කිරීමටත් 2023-09-11 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, සාකච්ඡා සම්මුති කමිටුව විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව යුනයිටඩ් සෝලර් එනර්ජි සමාගම සමඟ යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ ඊට අදාළව විදුලිය මිල දී ගැනීමේ ගිවිසුමකට අත්සන් තැබීම පිණිස විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 18. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු සඳහා වන සංශෝධන

2024-01-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව වර්ෂයකට බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන 80 සිට රුපියල් මිලියන 60 දක්වා අඩු කිරීම සඳහාත්, එකතු කළ අගය මත බදු අනුපාතය 15% සිට 18% දක්වා වැඩි කිරීම සඳහාත් විධිවිධාන පනවමින් 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම පිණිස 2023-10-30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. නීති කෙටුම්පත් සම්පාදක විසින් අදාළ සංශෝධන ඇතුළත් කර සංශෝධන පනත් කෙටුම්පත, කෙටුම්පත් කර ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී තිබේ. ඒ අනුව, එම සංශෝධන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 19. දඹමාම ගුවන්තොටුපොළෙහි දී සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ගුවන්යානා සඳහා ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම

සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගමේ ගුවන්යානා සඳහා දඹමාම ගුවන්තොටුපොළෙහි ගුවන්යානා ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තුව 2023-12-31 වන දිනෙන් අවසන් වීමට නියමිතව ඇත. දැනට එහි සිටින එකම ගුවන්යානා ඉන්ධන සැපයුම්කරු වන Modern Consortium for Refuelling Aircraft Co. Ltd. (MCRA) සමාගම වෙතින් පමණක් මිල ගණන් කැඳවා තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර

ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය පරිදි අදාළ කොන්ත්‍රාත්තුව සෘජු කොන්ත්‍රාත්වක් වශයෙන් ප්‍රදානය කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

20. **ගුවන්තොටුපොළවල් 09ක දී සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම සඳහා ගුවන්යානා ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තු පිරිනැමීම**

සීමාසහිත ශ්‍රීලංකන් ගුවන් සමාගම වෙත බැංකොක්, බීජිං, ඩුබායි, හයිද්‍රාබාද්, කරච්චි, මාලේ සහ රියාද් යන ගුවන්තොටුපොළවල්වලදී ගුවන්යානා ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තු 2024-02-29 වන දිනෙන් ද, ක්වාලාලම්පූර් හා ජකර්තා යන ගුවන්තොටුපොළවල්වලදී ගුවන්යානා ඉන්ධන සැපයීමේ කොන්ත්‍රාත්තු 2024-03-31 වන දිනෙන් ද අවසන් වීමට නියමිතව තිබේ. එකී ගුවන්තොටුපොළවලදී ඉන්ධන සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා ඇත. ගුවන්යානා ඉන්ධන සැපයුම් සමාගම් 11ක් විසින් ලංසු ඉදිරිපත් කර ඇති අතර, කරච්චි ගුවන්තොටුපොළ සඳහා එක් ලංසුවක් සහ ඉතිරි ගුවන්තොටුපොළවල් 8 සඳහා ලංසු 02ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ලැබී තිබේ. ඒ අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ පරිදි සාරානුකූලව ප්‍රතිචාර දක්වන ලද අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ලංසුකරුවන් වෙත අදාළ කොන්ත්‍රාත්තු පිරිනැමීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

21. **2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නව නියමයක් නිකුත් කිරීම**

ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු සහ ජංගම සංක්‍රාමවලට අදාළ ප්‍රතිමුඛ ප්‍රේෂණ 2020 අප්‍රේල් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි තාවකාලිකව අත්හිටුවීමට/සීමා කිරීමට හැකි වන පරිදි 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නියමයක් නිකුත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඉන් අනතුරුව, එකී නියමයේ වලංගු කාලසීමාව අවස්ථා කිහිපයකදී දීර්ඝ කිරීමට පියවර ගනු ලැබ ඇති අතර, වත්මන් නියමයේ වලංගු කාලය 2023-12-27 දිනෙන් අවසන් වීමට නියමිතව තිබේ. වත්මන් නියමයේ දක්වා ඇති අත්හිටුවීම්/සීමා කිරීම් පවත්වා ගනිමින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා සේවා නියුක්තිකයන්ගේ කොටස් අයිති යෝජනා ක්‍රමවල හෝ සේවා

නියුක්තිකයන්ගේ කොටස් මනාප යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීම සඳහා තනි නේවාසික පුද්ගලයන් සඳහා පැවති අත්හිටුවීම ඉවත් කරමින්, 2023-12-28 දින සිට බලාත්මක වන පරිදි තවත් මාස 06 කාලසීමාවක් සඳහා නව නියමයක් නිකුත් කිරීමටත්, එලෙස නිකුත් කරන නියමය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

*************